# බටහිර විද්‍යා සඟරාවකට හෝමියෝපති අගුණ වීම

බටහිර විද්‍යාඥයා යනු කවු ද? මෙයට පිළිතුරු තුනක් ඇත. එක් පිළිතුරකට අනුව බටහිර විද්‍යාව ඉගෙන ගත් තැනැත්තෙක් බටහිර විද්‍යාඥයෙක් වෙයි. මෙහි දී ප්‍රශ්නය වනුයේ කෙතරම් දුරට ඉගෙන ගෙන ඇත් ද යන්න ය. උසස් පෙළට, ප්‍රථම උපාධියට, පශ්චාත් උපාධියට ආදී වශයෙන් විවිධ මට්ටම්වලට බටහිර විද්‍යාව උගත්තෝ වෙති. ඔවුන්ගෙන් කවුරු බටහිර විද්‍යාඥයෝ වෙත් ද? මේ සම්බන්ධයෙන් සම්මතයක් නැත. එබැවින් අවශ්‍ය නම් බටහිර විද්‍යාව ඕනෑම මට්ටමකට උගත් අයකුට තමන් බටහිර විද්‍යාඥයකු යැයි හඳුන්වා දිය හැකි ය. එහෙත් සමාජයේ අඩුම තරමින් පශ්චාත් උපාධිධාරීන්වත් බටහිර විද්‍යාඥයන් ලෙස හඳුන්වනු නොලැබේ. එයට හේතුව කුමක් වුවත් සාමාන්‍යයෙන් බටහිර විද්‍යාඥයා නැත්නම් සමාජය කියන අන්දමට විද්‍යාඥයා කී විගස සිහියට එන්නේ අයිසැක් නිව්ටන්, ඇල්බට් අයින්ස්ටයින් ආදී විද්වතුන්ගේ නම ය. මේ බටහිර විද්‍යාඥයා යන්නට ලැබෙන දෙවැනි පිළිතුර ය.

මේ අන්ත දෙකින් බැහැර ව බටහිර විද්‍යාව යම් ප්‍රමාණයකට හදාරා එයට යම් එකතුවක් කර ඇති අයකු බටහිර විද්‍යාඥයකු ලෙස හැඳින්වීම තුන්වැනි පිළිතුරයි. ඒ අර්ථයෙන් ගත්කල ලංකාවෙන් බිහි වූ බටහිර විද්‍යාඥයෝ (හා ගණිතඥයෝ) රාශියක් වෙති. ඉන් බහුතරය ලංකාවෙන් පිට සේවය කරන්නේ යැයි සිතමි. අද අප වැනි රටවල් බටහිර රටවලට හා තමන්ට වඩා පොහොසත් රටවලට බටහිර විද්‍යාඥයන් හා වෙනත් එවැනි උගතුන් නොමිළයේ සපයන රටවල් බවට පත් වී ඇත. ඔවුන්ගේ සේවයට ඒ ඒ රටවලින් වැටුපක් ලැබෙන බව සැබෑ ය. එහෙත් ඒ පුද්ගලයන් බිහි කිරීම පිළිබඳ ව කිසිම මුදලක් අර දුප්පත් රටවලට නොලැබෙයි. සියල්ල භාණ්ඩ බවට පත් වී ඇති සමාජයක මානව සම්පත් බිහි කිරීම භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමක් ලෙස නොසැලකීම පිළිබඳ ව මා සතුටු වන නමුත් එසේ නොසැලකෙන්නේ ඇයි ද යන්න නම් තරමක ගැටළුවක් වෙයි.

බටහිර විද්‍යාඥයා යන්නට ඉහතින් දී ඇති නිරවචන තුන වාස්තවික හා ඇගයීම් රහිත වන්නේ නොවේ. අපට එකවර පැහැදිලි නොවුණ ද, එහි යම් ඉගෙනුමක් ගැන සඳහන් වෙයි. මේ ඉගෙනුම ලබා දෙන්නේ කවු ද? ඕනෑම අයකු ලබා දෙන ඉගෙනුමක් මෙහි දී වලංගු නොවන බව පැහැදිලි විය යුතු ය. සමාජය විසින්, එනම්, මෙරට දී නම් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් හා දැන් නම් ඊනියා ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් සමාගම් ලියා පදිංචි කරන ආයතනය විසින් පිළිගනු ලැබූ ආයතන හා ඒ ආයතන මගින් ලබාදෙන අධ්‍යාපනයට සමාන්තර අධ්‍යාපනයක් ලබා දෙන උපකාරක පංති මගින් ලබා දෙන අධ්‍යාපනය මෙහි දී අදාළ අධ්‍යාපනය වෙයි. විද්‍යුසර පුවත්පත මගින් මා ලබා දෙන අධ්‍යාපනය ලබා ගත් අයකු බටහිර විද්‍යාව පිළිබඳ ඉගෙනුමක් ලත් අයකු ලෙස සමාජය විසින් පිළිගනු ලැබීමට තිබෙන ඉඩකඩ ඉතා අඩු ය. එසේ පිළිගැනෙන්නේ නම් එයට එකම හේතුව මා ද බටහිර විද්‍යා අධ්‍යාපනයක් සමාජය විසින් පිළිගැනෙන ආයතනවලින් ලබාගෙන තිබීම පමණ ය. මගේ අදහස්වල වැරැද්ද හෝ නිවැරැද්ද හෝ මෙහි දී බල නොපායි.

බටහිර විද්‍යාවට යම් එකතුවක් කිරීම ගැන පිළිබඳ ව පවතින නීති රීති මෙයට ද වඩා දැඩි ය. බටහිර විද්‍යාවට යම් එකතුවක් කළ බව පිළි ගැනෙන්නේ එක්කෝ ඒ එකතුව අඩංගු නිබන්ධනයකට පිළිගත් ආයතනයක් මගින් උපාධියක් ලබා දීමෙනි. නැත්නම් ඒ එකතුව පර්යේෂණ පත්‍රිකාවක් ලෙස පිළිගත් සඟරාවක පළ කරනු ලැබීමෙනි. එසේත් නැත්නම් පිළිගත් ආයතනයක සැසිවාරයකට ඒ පත්‍රිකාව ඉදිරිපත් කරනු ලැබීමෙනි. මෙහි දී වැදගත් වචනය වනුයේ පිළිගත් යන්න ය. ඕනෑම ආයතනයකට, ඕනෑම සඟරාවකට මේ පිළිගත් යන විශේෂණය නොලැබෙයි. කෙතරම් අළුත් අදහසක් වුව ද එලෙස පිළිගත් සඟරාවක් හෝ පිළිගත් ආයතනයක් හෝ නොපිළිගන්නේ නම් එය බටහිර විද්‍යාවට කරන එකතුවක් ලෙස නොපිළිගැනෙයි. එය දැනුමක් ලෙස නොපිළිගැනෙයි.

දැනට අවුරුදු දහ හතරකට පමණ පෙර, 1988 වසරෙහි දී, හෝමියෝපති වෙදකමට අදාළ පත්‍රිකාවක්, එනම් හෝමියෝපති වෙදකමේ මූල ධර්මය පිළිගැනෙන පත්‍රිකාවක් එංගලන්තයේ නේචර් සඟරාවෙහි පළවිණි. නේචර් යනු බොහෝ විට බටහිර විද්‍යාවේ ප්‍රධාන සඟරාව ලෙස පිළිගැනෙයි. එහි විවිධ ක්ෂෙත්‍රවලට අදාළ පර්යේෂණ පත්‍රිකා පළවෙයි. මේ හෝමියෝපති වෙදකමට යම් පිළිගැනීමක් ලැබෙන පත්‍රිකාව නේචර් සඟරාවෙහි පළ වූ වහාම ඇලොපති වෛද්‍යවරු, එනම් අප දොස්තරලා ලෙස හඳුන්වන බටහිර වෛද්‍යවරු කලබලයට පත්වූහ. අදාළ පර්යේෂණය කර

© Prof. Nalin De Silva

තිබුණේ ප්‍රංශයේ පරයේෂණ ආයතනයක ය. බටහිර වෛද්‍යවරුන්ගේ හා බටහිර විද්‍යඥයන්ගේ තදබල විරෝධතාවය හමුවේ ඒ පත්‍රිකාව පළ කිරීම පිළිබඳ ව නේචර් සඟරාවට කණගාටුව පළ කිරීමට සිදු වූ අතර එය නිපත්‍රිකාවක් (නිපන්දුවක් මෙන්) ලෙස ඉවත් කෙරිණි. මේ පිළිබඳ කෙටි විස්තරයක් මම ඒ දිනවල ම විදුසර පත්‍රයෙහි පළ කෙළෙමි. එහෙත් ඒ ක්‍රියාවෙහි වැදගත්කම අවබෝධ කර ගැනීමට එකල අප රට සමාජය දැන් තරමටවත්  සූදානමක නොවී ය.

මෙහි දී සිදු වූයේ කුමක් ද? හෝමියෝපති වෙදකම බටහිර බිහිවුව ද (එය ජර්මනියේ බිහි විණි) එය ඇලොපති වෙදකමේ මූල ධර්මවලට පටහැනි මූල ධර්ම මත පදනම් වෙයි. හෝමියෝපති වෙදකමට පදනම් වූ චින්තනය, බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනය නොව, සංසේලෂණය හා සහජීවනත්වය පිළිබිඹු කෙරෙන චින්තනයකි. පසුගිය අවුරුදු එකසියයක පමණ කාලයක් තුළ බටහිර ම වෙනත් චින්තනයකට ඉල්ලුමක් ඇති වී තිබෙන බව මා සඳහන් කර ඇත. එහෙත් බටහිර අධිපතිවාදී යුදෙව් චින්තනය වෙනත් චින්තනයකට ඉඩක් හෝ පිළිගැනීමක් හෝ ලබා දීමට සූදානම් නැත. එබැවින් වෙනත් චින්තනයක් මත පදනම් වූ හෝමියෝපති වෙදකමට කිසියම් වූ ආකාරයක පිළිගැනීමක් බටහිර නොලැබෙයි. නේචර් සඟරාවට අදාළ පත්‍රිකාව ඉවත් කිරීමට සිදු වූයේ එවැනි පසු බිමක ය. කතා කිරීමේ නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස ආදිය ගැන පුරසාරම් දොඩන බටහිරයන් ක්‍රියා කරන්නේ එපරිද්දෙනි. බටහිර විද්‍යාවේ ද අදහස් ප්‍රකාශ කිරීමට හැකි වන්නේ ඒ අදහස් බටහිර යුදෙව් චින්තනයෙහි මුලට පහර නොගසන්නේ නම් පමණකි. හෝමයෝපති වෙදකමේ පදනම ගැන කියැවුණු පත්‍රිකාවකට ලැබුණු තැන එය නම් ආයුර්වේදයේ හෝ සිංහල වෙදකමේ හෝ පදනම ගැන ලියැවුණු පත්‍රිකාවකට කිනම් තැනක් ලැබෙනු ඇත් ද?

අද බටහිර රටවල ඊනියා වෛකල්පික වෛද්‍ය ක්‍රමවලට තැනක් නැත්දැයි කිසිවකු ඇසීමට ඉඩ තිබේ. ප්‍රශ්නයට පිළිතුර ප්‍රශ්නයෙහි ම ඇත. අසන්නේ වෛකල්පික වෛද්‍ය ක්‍රමවලට තැනක් නැත් ද යන්න ය. ඉන් කියැවෙන්නේ බටහිර ඇලොපති වෛද්‍ය ක්‍රමය අධිපතිවාදී ප්‍රධාන වෛද්‍ය ක්‍රමය ලෙස පිළිගැනෙන බවත් අනෙක් වෛද්‍ය ක්‍රම ඊනියා වෛකල්පික වෛද්‍ය ක්‍රම බවත් ය. අනෙක් වෛද්‍ය ක්‍රම වෛකල්පික වෛද්‍ය ක්‍රම ලෙස පැවතිය හැකි ය. අවශ්‍ය නම් ඒවාට අදාළ සඟරා ද පළ කළ හැකි ය. එහෙත් එහි දී ප්‍රධාන වෛද්‍ය ක්‍රමය කුමක් ද යන්න පිළිබඳ ව ප්‍රශ්නයක් තිබිය නොහැකි ය. ප්‍රධාන වෛද්‍ය ක්‍රමයේ හා අධිපතිවාදී ප්‍රධාන දැනුම් පද්ධතියේ සඟරාවල අනෙක් දැනුම්වලට ඉඩක් නැත. අනෙක් වෛද්‍ය ක්‍රමවලින් හා අනෙක් දැනුම් පද්ධතිවලින් නොයෙකුත් දෑ ලබා ගැනීමට ද බටහිර වෛද්‍ය විද්‍යාව හා පොදුවේ ගත්කල බටහිර විද්‍යාව හා බටහිර දැනුම් පද්ධති පසුබට නොවෙයි. එහෙත් එසේ ගන්නේ ඒ අනෙක් පද්ධතිවල දැනුම තම දැනුම් පද්ධතියට අවශෝෂණය කර එහි කොටසක් බවට පත් කරමිනි. කොතළ හිඹුටු පිළිබඳ දැනුම බටහිර රසායන විද්‍යාවට හා බටහිර වෛද්‍ය විද්‍යාවට එක්වන්නේ ඒ අයුරින් මිස සිංහල වෙදකමේ දැනුමක් ලෙස නොවේ.

අපේ රටේ සිටින ඇංකර් ප්‍රබුද්ධයෝ, එනම් මහාරාජා සමාගම ඇංකර් හඳුන්වා දෙන ආකාරයට බටහිර ඇති විවිධ මතිමතාන්තර සිංහල පාඨකයාට හඳුන්වා දෙන්නෝ, මේ කිසිවක් නොදනිති. ඔවුන් ඒ බව දැන ගන්නේ කෙසේ ද? බටහිරයෝ ඒ බවක් කිසි දිනෙක නොකියති. බටහිර අධිපතිවාදී චින්තනයක්, අධිපතිවාදී සංස්කෘතියක්, අධිපතිවාදී දැනුම් පද්ධතියක් ඇති බව නොදන්නා ඇංකරයෝ බහු සංස්කෘතික සමාජයක් ගැන මැත දොඩවති. ඉංගිරිසියෙන් ඇති දෙයක් තම තම නැණ පමණින් වටහාගෙන එය සිංහලෙන් ලිවීමෙන් ඇංකරයකු විය හැකි නමුදු ප්‍රාඥයකු නම් විය නොහැකි ය. මා මෙයින් අදහස් කරන්නේ බටහිර දැනුම සිංහලෙන් පළ නොකළ යුතු බව නොවේ. එය කළ යුතු ය. එහෙත් ඒ අතර එය බටහිර දැනුම බව ද එයට පදනම් වූ චින්තනයක් ඇති බව ද, ඒ චින්තනය අපේ නොවන බව ද අපි වටහා ගත යුතු වෙමු.

ඉහත සඳහන් කෙළේ  හෝමියෝපති වෙදකමේ පදනම ගැන ලියැවුණු පත්‍රිකාවකට බටහිර වෛද්‍යවරුන්, බටහිර විද්‍යාඥයන් හා නේචර් සඟරාව සැළකූ ආකාරය ය. හෝමියෝපති වෙදකම පසෙකට දමමු. බටහිර විද්‍යාවේ ම වුවත් අධිපති මතවාදයට පිටින් යන අදහස්වලට බටහිර ප්‍රධාන සඟරාවල හා ආයතනවල තැනක් නොලැබේ. මේ සඳහා ප්‍රධාන උදාහරණ දෙකක් මෙහි දී සඳහන් කළ යුතු ය. එක් උදාහරණයක් බටහිර විශ්වවේදයෙනි (කොස්මොලොජි). බටහිර විශ්වවේදයෙහි හැදෑරෙන්නේ විශ්වයේ සම්භවය, එහි විකාශය, එහි ප්‍රසාරණය, ඈත පිහිටි මන්දාකිණි, ක්වේසාර, කළු කුහර, ගුරුත්වජ කාච ආවරණය ආදියයි. ක්වොන්ටම් භෞතිකය, අයින්ස්ටයින්ගේ සාධාරණ සාපේක්ෂතාවාදය, න්‍යෂ්ටික භෞතිකය ආදිය මෙහි දී යොදා ගැනෙයි. අද විශ්වයේ සම්භවය සම්බන්ධව ඇති බටහිර

© Prof. Nalin De Silva

අධිපති මතවාදය හෙවත් ප්‍රවාදය (ඕනෑම ප්‍රවාදයක් මතවාදයක් පමණකි.) හෙවත් කතාව (ප්‍රවාදයක් යනු කතාවක් මිස අනෙකක් නොවේ. සාමාන්‍ය ජනතාවගේ කතා ජනප්‍රවාද වෙයි. බටහිර විද්‍යාඥයන්ගේ කතා ප්‍රවාද වෙයි!) සාධාරණ සාපේක්ෂතාවාදය හා ක්වොන්ටම් භෞතිකය ඇසුරින් ගොඩ නැගුණකි. එය මහා පිපුරුම යනුවෙන් හැඳින්වෙයි.

මහා පිපුරුමේ විවිධ ප්‍රභේද ඇතත් මූලික වශයෙන් ඉන් කියැවෙන්නේ අවුරුදු ප්‍රකෝටි පහළොවකට පමණ පෙර මුළු මහත් විශ්වය ම අබමල් රේණුවකට ද වඩා කුඩා වූ පරිමාවක් තුළ හදිසියේ ප්‍රාදුර්භූත වූ බවත් ඉන් පසු එය අද වන තුරු ද දිගින් දිගට ම ප්‍රසාරණය වන බවත් ය. මේ ප්‍රසාරණය අතීතයේ දී කෙසේ සිදු වීද පිළිබඳ ව මතභේද ඇත. ඉතා කෙටි කාලයක් තුළ විශ්වය උද්ධමනාකාරී ලෙස (ඉන්ෆ්ලේෂන් - උද්ධමනය ඇත්තේ ආර්ථිකයේ පමණක් නොවේ.) ප්‍රසාරණය වූ බවත් පසුව ප්‍රසාරණය වීමේ සීඝ්‍රතාවය අඩු වූ බවත් සමහරු කියති. මේ වසරේ දී ඉදිරිපත් වූ මතයක් අනුව මෙම්බ්රේන් (විශ්ව) යනුවෙන් හැඳින්වෙන වස්තු ගැටීමෙන් විශ්වය (විශ්ව) නිර්මාණය වී ප්‍රසාරණය වෙයි. මේ කිනම් මතයක වුව ද කියැවෙන ප්‍රධාන කරුණ නම් විශ්වයට ආරම්භයක් ඇති බව ය. මෙම්බ්රේන් මතය ඉදිරිපත් කළ පසු ඇතැමුන් ඉන් විශ්වයට ආරම්භයක් නැති බව කියැවෙන්නේ යැයි විශ්වාස කළ ද දැන් ඒ මතයෙන් ද අවසාන වශයෙන් ගත් කල විශ්වයට ආරම්භයක් ඇතැයි කියැවෙන බව සනාථ වී ඇත.

මහා පිපුරුම් මතවාදය අනුව විශ්වය අවකාශය වශයෙන් ගත් කළ සමමිතික වෙයි. එනම් කිනම් දිශාවකට ගිය ද මහා පරිමාණයෙන් ගත් කල විශ්වයේ වෙනසක් දැකිය හැකි නොවේ. සුළු පර්මාණයෙන් ගත් කල ඇතැම් දිශාවක් දිගේ තාරකා හෝ මන්දාකිණි හෝ අනෙක් දිශාවකට වැඩියෙන් දැකිය හැකි ය. එහෙත් ඈතට ඈතට යන විට මේ වෙනස් කම් නැති වී යයි. අපට මෙහි දී වැදගත් වන්නේ විශ්වයට ආරම්ශයක් ඇතැයි යන්නත්, එය හදිසියේ අබමල් රේණුවකට ද වඩා කුඩා පරිමාවක් තුළ ප්‍රාදුර්භූත වූ බවත්, විශ්වය අවකාශය වශයෙන් ගත් කළ සමමිතික බවත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva